257

පුද්ගල

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති උපාධිය (2002) ප්‍රදානය කිරීම පිණිස පරිපූර්ණ කෘතියක් ලෙස මෙම ග්‍රන්ථය පරීක්ෂක මණ්ඩලය විසින් පිළිගන්නා ලදි. විශ්විද්‍යාලයේ ලිඛිත අනුමැතියෙන් තොරව මෙය කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා පිළිගත් ග්‍රන්ථයක් ලෙස මුද්‍රණය කිරීමට අවසර නොමැති බව සැලකිය යුතුයි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග

# ග්‍රාමීය අංශයේ සංවර්ධන ක්‍රියාවලිය තුළ ප්‍රජා සංවිධාන වල දායකත්වය.

විමල් දිසානායක

දැඅවුරුදු සමාජීය විද්‍යාපති (පර්යේෂණ) උපාධි පාඨමාලාව සඳහා ඉදිරිපත් කරනලද පර්යේෂණ නිබන්ධයකි.

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 257 |
| වර්ග අංකය | |

කැළණිය විශ්ව විද්‍යාලය
2000- ඔක්තෝබර්.

# නිබන්ධ සාරාංශය


මෙම නිබන්ධය සඳහා භූගෝලීය වශයෙන් හඳුනාගන්නා හියාරේ දකුණ ගම්මානයේ බිහිවී ඇති ප්‍රජා සංවිධාන සංඛ්‍යාව 19 කි. බිහිවී ඇති සියළුම ප්‍රජා සංවිධාන කිසියම් මූලික අරමුණකින් බිහිව ඇත. පවුල් 223 ක් වශයෙන් ජීවත්වන මෙම එකම ජන කොටස මෙම සංවිධානවල තනතුරු මෙන්ම සාමාජිකත්වය ද දරනු ලබති. එමෙන්ම එකම අරමුණක් සඳහා කටයුතු කරන ප්‍රජා සංවිධානද ගණනාවකි. කෙසේ වෙතත් සෑම සංවිධානයකම අවසන් අරමුණ වන්නේ ප්‍රජාවගේ ආර්ථික සමාජ, දේශපාලනික, සංස්කෘතික උන්නතියයි. එහෙත් ගම තුළ මෙබඳු සංවිධාන රැසක් තිබියදී මූලික වශයෙන් දිළිඳුකමේ ප්‍රමාණාත්මක බවේත් ගුණාත්මක බවේත් වර්ධනයක් සිදුවෙමින් පවතී. එබැවින් මේ පිළිබඳ පවත්නා යථා ස්වභාවය හඳුනා ගැනීමට මෙම ගවේෂණය තුළින් උත්සාහ ගන්නා ලදී.

මේ සඳහා මෙම ග්‍රන්ථයේ උපැඳි වලින් දක්වා ඇති පරිදි නිර්මාණය කෙරුණු ගෘහ තොරතුරු ආකෘති පත්‍රය යොදා ගනිමින් ගෘහ තොරතුරු රැස්කර කර ගන්නා ලදී. ගෘහ තොරතුරු රැස් කිරීමට මත්තෙන් ප්‍රජා සංවිධාන වල මූලිකයන්, ගැමිනායකයන්, හා ගැමියන් සහභාගි කරවාගෙන කෙරුණු සාකච්ඡාවකින් මෙම ගවේෂණ ක්‍රියාවලියේ අරමුණු පැහැදිලි කර ගැණුනි. ඒ තුළින් සාම්ප්‍රදායික සමීක්ෂණ ක්‍රමයෙන් බැහැර වෙමින් විමර්ශනශීලීව වඩාත් සත්‍ය තොරතුරු ලබා ගැනීමටද උත්සාහ ගැනුනි.

මෙම ග්‍රන්ථයේ උපැඳි වලින් (අංක 4) දැක්වෙන ප්‍රජා සංවිධාන සඳහා වූ ආකෘති පත්‍රය යොදා ගනිමින් ප්‍රජා සංවිධාන මූලිකයන් සමග මෙන්ම ගැමියන් සමගත් බාහිරයන් සමගත් කෙරුණු සාකච්ඡාවක්ද සහාය කර ගැනිම තුළින් මෙම තොරතුරු පෝෂණය කර ගැනීමට කටයුතු යොදා ගැනුනි.

සමීක්ෂණය පිළිබඳ ආකෘති පත් වලින් ලැබුණු ගෘහ තොරතුරු පිළිබඳ වූ සාරාංශ කරනයක්ද සහිතව පර්යේෂක විසින් ගැමියන් 15 දෙනෙකු සමග කඩිනම් ගැමි විමසුම් ක්‍රමය (PRA) යොදා ගනිමින් සමාජ සිතියම ලකුණු කිරීම ගම පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ගොඩනගා ගැනීමට බෙහෙවින්ම ඉවහල් විය. ගමේ යථා ස්වභාවය මෙන්ම ගම ක්‍රියාත්මක වීම සඳහා සමාජ ස්ථරයන්ගේ බලපෑමද සමාජ සිතියම ලකුණු කිරීම තුළින් හෙළිදරව් කර ගැනීමට හැකි විය. ප්‍රජා සංවිධාන පිළිබඳ ආකෘති පත්‍රය භාවිතා කරමින් හඳුනාගත් තොරතුරු මෙන්ම ඒවා පිළිබඳ විග්‍රහයන්ද සහිතව ගැමියන් 28 දෙනෙකු සමග පැවැත්වූ අර්ධව්‍යුහගත සාකච්ඡාව ගම තුළ පවතින සියළුම ප්‍රජා සංවිධාවල අක්‍රියාරීබව ක්‍රියාකාරීබව සහ වඩාත් ඵලදායි ප්‍රජා සංවිධානයක් ගොඩ නගා ගැනීමේදී සළකා බැලිය යුතු අවස්ථාවන්ද මෙම අර්ධ ව්‍යුහගත සාකච්ඡාව තුළින් මතුකරගන්නා ලදී.

ගම තුළ පොදුවේ පවතින හා ඒ ඒ පවුල් වලට බලපාන සංවර්ධන ගැටළු වලදී ප්‍රජා සංවිධාන ඊට විසඳුම් සැපයීම සඳහා දරා ඇති උත්සාහයන්ද අහඹු ලෙස හඳුනාගත් ගැමියන් හා ගැමිනායකයන් සමග පෞද්ගලිකවත් සාමූහිකවත් දීර්ඝවශයෙන් සාකච්ඡා කරනලදී. එම සාකච්ඡා තුළින් මතුකරගන්නාලද අවස්ථාවන් ද ප්‍රජා සංවිධාන ක්‍රියාවලිය හා ගමේ සමාජ ආර්ථික සංවර්ධනාත්මක සම්බන්ධතාව පිළිබඳ යථාස්වභාවය හෙළිදරව් කරන්නක් විය.

හඳුනාගත් ගැමිනායකයන්, ග්‍රාමනිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, විහාරාධිපතින් වහන්සේ ආදීන් සමග දීර්ඝ වශයෙන් පැවැත්වූ සම්මුඛ සාකච්ඡා සමස්තයක් ලෙස ගම පිළිබඳවත් ප්‍රජා සංවිධාන පිළිබඳවත් වශයෙන් අංශ දෙකක් යටතේ සිදුකරනලදී. විශේෂයෙන් මේ වන විට පර්යේෂක රැස්කරගත් තොරතුරු නැවත විමසුමට ලක්කරමින් ඒවායේ සත්‍යාසත්‍ය තාවයන් නැවත හඳුනාගැනීමටද උත්සාහ ගන්නා ලදී

විශේෂයෙන් මෙම ගවේෂණ ක්‍රියාවලිය තුළ ප්‍රජාවටද ගම සහ ගමේ ප්‍රජා සංවිධාන පිළිබඳ නව ආරකින් දකින්නට ඉඩකඩ ලැබීම ප්‍රබල ප්‍රතිඵලයකි.

ප්‍රජා සංවිධාන ගණනාවක් විවිධ අරමුණු වලින් මෙන්ම එකම අරමුණ සඳහා බිහිව තිබුණත් ඒවා නාම මාත්‍රිකව සහ ගමේත් ප්‍රජාවගේත් සමාජ ආර්ථික, ගැටළු හා ගලපා බලන විට ඉතා සුළු ක්‍රියාකාරකම් වල නිරතව සිටීමත්, මෙම ගවේෂණ ක්‍රියාව තුළින් ඉතා පැහැදිලි ලෙස හඳුනාගන්නට ලැබී ඇත.

එහෙත් දස වසරක පමණ ඓතිහාසික තොරතුරු වලින් අනාවරණය වන පරිදි "ගම" තුළ කිසියම් සංවර්ධනයක් සිදුව ඇත. එය ඉතා පැහැදිලි ලෙස තේ වගාව මුල් කරනිමින් පොදුවේ රට තුළ සිදුවන සංවර්ධන ක්‍රියාදාමය හරහා සිදුවූවකි.

කෙසේ වෙතත් අවසන් වශයෙන් ගම සහ ගමේ වෙසෙන ප්‍රජාව සඳහා වන සංවර්ධන ගැටළු සඳහා විසඳුම් සැපයීමට හැකි ශක්තිමත් යථාර්ථවාදී සංවර්ධන ක්‍රියාවලියක් ප්‍රජා සංවිධනය හරහා නිර්මාණය කිරීමට ඉඩකඩ ඇති බවද මෙම ගවේෂණ ක්‍රියාවලිය තුළින් හඳුනාගන්නාලදී.